## සැප්තැම්බර් කළාපයට අදාල ප්‍රහේලිකාවේ විසඳුම

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 අ | 2 ස | 3 ම | | | | 4 ම | න |
| 5 ස | න් | තු | 6 සි | 7 ත | දෙ | වි | |
| ර | | | 8 තු | රු | | පි | |
| 9 න | 10 ය | 11 න | මි | ණ | | 12 ය | 13 ල |
| 14 ස | ම | ර | ණ | | 15 කො | න් | ද |
| ර | | නි | | 16 ර | න් | | |
| ණ | | 17 දු | 18 රා | තී | ත | 19 ය | 20 ක |
| | 21 ජ | න් | ම | | 22 ය | ස | ය |

### හරහට

1. සමාන නැති
4. සිත
5. බෝධිසත්ව ජන්මයකි
8. ගස්
9. ඇස නමැති මැණික
12. ගොවිතැන් කරන කන්නයකි
14. සිහියට නගන
15. සවිමත්ව තිබිය යුත්තකි
16. දැන් දැන් කැළණි ගං පතුලෙන් ද හමුවේ
17. පුරාණ කාලයක
19. උපත්
21. උපත හා සම්බන්ධ වදනකි
22. අටලෝදහමින් එකකි
19. නාදය

### පහළට

1. නම්බු නාමයකි
2. සංඥා
3. අනාගතයේ
4. පළමු ගුරුවරුන්
6. සිතූ පැතූ සම්පත් ළඟාකර දෙයි
7. යොවුන්
10. නිරයට සම්බන්ධය
11. රජුන්
13. ලැබුණ
15. ආභරණයකි
16. මාර දූවරුන්ගෙන් කෙනෙකි
18. ධසරත ගේ පුත්
19. ප්‍රථම ද්වේවාචික උපාසකයා
20. අතීතයේ දී සන්නිවේදන කටයුතු වලට මෙන්ම දඬුවම් දීමට ද භාවිතා විය




## වැඩ සහ ආහාර

ගොවියෙක් මහලු වියට පත් වුණා. වැඩක් පලක් කරන්නට හැකියාවක් නැතිකම නිසා ඔහු ආලින්දයේ පුටුවකට බර දී හාන්සි වී දවසේ වැඩි හරියක් කාලය ගත කළා. ගොවිපලේ වැඩ කරමින් සිටි ඔහුගේ පුතා වරින් වර තාත්තා කරන්නේ කුමක්දැයි විපරම් කර බැලූවා.

"දැන් එයාගෙන් ඇති වැඩක් නෑ. එයා කිසි ම දෙයක් කරන්නේ නෑ." පුතා සිතුවා.

තාත්තා ගැන කලකිරීමට පත් වූ පුතා මිනී පෙට්ටියක් හැදුවා. එය ආලින්දයට ගෙනැවිත් තාත්තාට එයට ගොඩ වෙන්නට කීවා. මහල්ලා කිසි කතාබහක් නැතිව මිනී පෙට්ටිය ඇතුළේ වැතිරුණා. පුතා මිනී පෙට්ටිය කරත්තයක පටවාගෙන ගොවිපලේ කෙළවර දක්වා ගෙන ගියා. වත්ත මායිමෙන් පස්සේ ගැඹුරු හෙලක්. වත්තේ කෙළවරට ළඟා වන අවස්ථාවේ මිනී පෙට්ටියේ පියනට තට්ටු කරන හඬ ඇසුණා. ඔහු පෙට්ටියේ පියන විවෘත කළා.

"පුතා. මං දන්නවා ඔයා පෙට්ටිය හෙලට දමන්න හදන බව. ඒත් මං ඔයාට යෝජනා-වක් කරන්න කැමතියි."

"ඒ මොකක්ද?"

"ඔයාට ඕන නම් මාව හෙලට දමන්න." මහල්ලා සන්සුන් ලෙස කිව්වා. "ඒත් මේ පෙට්ටිය හදලා තියෙන්නේ වටිනා ලී වර්ගයකින්. ඒ නිසා පෙට්ටිය නාස්ති කරන්න ඕන නෑ. ඒක පරිස්සමින් තියා ගන්න. සමහරවිට ඔයාගේ දරුවන්ට ඒක ඕන වේවි."

**මහින්ද ගුණවර්ධන**

## Cartoon By Shanika Somatilake










